# තනතුරු ඇබෑර්තු

## සී/ස වත්තල විවිධ සේවා සමුපකාර සමිතිය

සී/ස වත්තල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩුව ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ගම්පහ දිස්ත්‍රික්කයේ වසර 02 ක ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ගෙන් **2025.06.17 දින සිට 2025.07.01** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | වැටුප් පරිමාණ අංකය හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | වයස් සීමාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|---|
| විගණන සහකාර | 103/7 III | 02 | අවු. 21-45 අතර | මූලික වැටුප - 16994<br>220 × 10 - 260 × 10<br>320 X 10-380 X 05, 26894 |
| කළමනාකරණ සහකාර | 104/9 III | 07 | අවු. 18-45 අතර | මූලික වැටුප - 14974<br>145 × 10 - 180 × 10<br>220 × 10 - 260 × 10 , 23024 |
| කම්කරු | 105/11 III | 02 | අවු. 18-45 අතර | මූලික වැටුප - 14234<br>120 × 10 - 130 × 10<br>145 × 10 - 180 × 10, 19984 |

උපරිම වයස් සීමාව සමුපකාර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා අදාළ නොවන අතර, සමුපකාර සේවයේ නියුතු අයදුම්කරුවන් දැනට සේවය කරනු ලබන සමුපකාර සමිතියේ අනුමැතිය සහිතව අයදුම්පත් යොමු කළ යුතුය.

ඉහත මූලික වැටුපට අමතරව බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත අනිකුත් දීමනාද හිමිවේ.

01. මෙම තනතුර ස්ථිරය. සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලට, සේවක අර්ථසාධක අරමුදලට, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායකත්වය හිමිය.

02. බඳවා ගැනීමේ සුදුසුකම් - ගම්පහ දිස්ත්‍රික්කයේ ඕනෑම විවිධ සේවා සමුපකාර සමිතියකින් ලබා ගත හැක.

03. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

04. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර, බඳවා ගැනීමේ නීති රීති අනුව යම් අයදුම්කරුවකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත අවලංගු කළ හැකිය.

05. අයදුම්පත යොමු කිරීම.

   I. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කරන්න.

   II. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2025.07.01 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අතින් ගෙනැවිත් භාරදීමටද හැකියාව ඇත.) මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

**සභාපති**
**සී/ස වත්තල විවිධ සේවා සමුපකාර සමිතිය,**
**අංක.380,මීගමු පාර, වත්තල.**